# බටට්ච්ච්ට යාළුවෙක්



තවින්සා දසුනි ගුණරත්න

# බටටිචිචිට යාළුවෙක්

තවින්සා දසුනි ගුණරත්න

# බට්ටිච්චිට යාළුවෙක්

| | | |
|---|---|---|
| කර්තෘ | : | තවින්සා දසුනි ගුණරත්න |
| ලිපිනය | : | 292D,<br>නෙරතල්දෙණිය මාවත,<br>පිළිමතලාව. |
| රූ සැකැස්ම | : | තවින්සා දසුනි ගුණරත්න |
| ප්‍රථම මුද්‍රණය | : | 2023 දෙසැම්බර් |
| ISBN අංකය | : | 978-624-208-005-5 |

# පිළිගැන්වීම

මාගේ ආදරණීය විදුහල් මෑණියන්,

මහාමායාවට

භක්ති පූර්වකව

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මහපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබ් සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් ‘‘දිවිය දිනන විද්‍යුත් පොතක්’’ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහොදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කල ‘‘දිවිය දිනන විද්‍යුත් පොතක්’’ ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදවු උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.
2023.11.01

# ස්තුති පිදුම

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියේ නිර්මාපක සෙනෙවිරත්න මහලේකම් ගුරු පියාණන්ටත්, පාසල තුල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියමුවානන් වූ මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය ශෂිකලා සේනාධීර මහත්මියටත්, මෙම ග්‍රන්ථය ලිවීම සඳහා මා දිරිමත් කරමින් මා හට මඟ පෙන්වූ සියළුම ගුරු මෑණිවරුන්ට සහ පියවරුන්ටත්, ඒ සඳහා උදවු උපකාර කළ අම්මාටත්, අප්පච්චීටත් මාගේ හෘදයංගම ස්තූතිය පුදකරමි.

එකෝමත් ඒක කාලෙක, එක පළාතක කොළ පාට ගස් පිරුණු වනාන්තරයක් තිබුණා. ඒ ගස් මලින් ලස්සන වෙලා, පළතුරු වලින් බර වෙලා තිබුණා. කැලේ සත්තු ඒවා ආහාරයට ගනිමින් සතුටින් ජීවත් වුනා. මේ කැලේ ජීවත් වුනා ලස්සන කරුණාවන්ත කුරුල්ලෙක්. කවුරුත් එයාට කතා කලේ චූටි කියලා.





දවසක් මේ චූටි වනාන්තරයේ කෑම සොයමින් යනකොට එයාට මහන්සියක් දැනුනා.

ඉතින් චූටි ලඟ තිබුනු ගසක අත්තක් උඩ වැහුවා විවේක ගන්න හිතාගෙන.





එහෙම ටික වේලාවක් විවේක ගන්න කොට “අනේ මාව බේරා ගන්න.” කියලා කවුදෝ කෑ ගසනවා චූටිට ඇහුනා.

“පවු. කාට හරි කරදරයක් වෙලා වගේ.” චූටි වට පිට බැලුවා. “මම ගිහින් එයාට උදවු කරන්න ඕන.” චූටි සද්දය ඇසෙන පැත්තට පියඹලා ගියා.




චූටි දැක්ක පුංචි කුරුළු පැටියෙක්, ගසක අත්තක් උඩ ඉදගෙන උදවු ඉල්ලලා කෑ ගහනවා. එයාගේ කකුල අත්ත වටේ එතුන වැලක පැටලිලා. “මම එයාව බේරා ගන්න ඕන”



“මොකද්ද ඔයාගේ නම” චූටි ඇහුවා. “මගේ නම බටිච්චි. අනේ මට මේ කකුල වැලෙන් ගලවා ගන්න උදවු කරන්න.” බටිච්චි කිවුවා. චූටි එයාගේ පුංචි හොටෙන් ඇනලා, හිම්හිට හිම්හිට පැටලුම ලිහුවා. “ඔන්න ඔයා නිදහස්” චූටි සතුටින් කිවුවා.

බට්ටිච්චිටත් හරි සතුටුයි. එයා චූටිට ගොඩාක් ස්තූති කලා. "අද ඉඳන් අපි දෙන්නා හොඳ යාළුවෝ වෙමු බට්ටිච්චි කිවුවා. "හොඳයි" චූටි කිවුවා. ඉතින් බට්ටිච්චිට අළුත් යාළුවෙක් ලැබුනා.





## පසු වදන

නූතන තක්ෂණික මෙවලම් භාවිතයට ඒකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොට ගෙන පොත පතින් දුරස් වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැන්වීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2024 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ත ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත් කතුවරියන්ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම්, නිර්මාණාත්මක හැකියාවන්, ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුත් පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්,
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023.11.01